සබරගමුව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල

2021 සැප්තැම්බර් 13 සිට සැප්තැම්බර් 20 දක්වා

සතිය - 20

විෂය :මව්බස

ශ්‍රේණිය - 2

සැකසුම :- එම්.එම්.බී.නිශානි මිය මිය /ර/ඇඹි/හල්මිල්ලකැටිය ම.වි. 3 ශ්‍රේණිය බාර

- දුවේ පුතේ" අපි සෙල්ලම් දුරකතනයක් හදමු

සෙල්ලම් දුරකථනයක් සාදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය පෙර දින සූදානම් කර ගන්න.

හිස් යෝගට් කෝප්ප 02ක් හෝ සබන් පෙට්ටි පියන් 02ක්

නූලක්,කුඩා

ඇණ දෙකක්

සාදන ආකාරය:-

- යෝගට් කෝප්ප දෙකේ හෝ හිස් සබන් පෙට්ටි පියන් දෙකේ යටි පැත්තේ හිල් 02ක් විද ගන්න .
- දැන් එම හිල්වලින් ඇතුලට නූල දමා ඇණයට ගැට ගසන්න
- දෙපැත්තේම එය නිවැරදිව කරන්න (වැඩිහිටියකුගේ උදව් ගන්න)
- • මෙහි දී හිස් සබන් පෙට්ටියකට ඩිමයි කොළ හෝ පාට A4 කඩදාසි අලවන්න.

• දැන් අංක හා අවශ්‍ය සංකේත ලියන්න.
• සුදුසු පරිදි පාට කරන්න.
• දැන් එළිමහනට යන්න.
• ඔබේ පවුලේ අයෙකු සමග කතා කරන්න
එහිදී මෙම ආචාර ධර්ම අනුගමනය කරන්න
* සුහදශීලී ආරම්භය
* පැහැදිලි වචන උච්චාරණය
* සවන් දෙමින් තම අදහස් ඉදිරිපත් කිරීම
* සුහදශීලී සමු ගැනීම

• කැමති මාතෘකාවක් ඔස්සේ මාතෘකා ඔස්සේ කතා කරන්න.

උදා:-

1. ඊයේ දවස ගැන
2. හෙට කළයුතු පාසල් වැඩ ගැන
3. මගේ පොතක් නැති වෙලා.

• ආදර්ශනයේ දී වැඩි අවධානය යොමු කළ අවස්ථා පිළිබඳ ව ගුරුවරයා අවධානය යොමු කරන්න